# ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
## රැකියා පිරිවිතරය.

| | | |
|---|---|---|
| තනතුර | - | මානව සම්පත් කළමණාකරු |
| පදනම | - | කොන්ත්‍රාත්/පැවරුම් |
| කාල සීමාව | - | මාස 6 කි (වර්ෂයක කාලයක් දක්වා දීර්ගකිරීමේ පදනම මත) |
| රාජකාරී ස්ථානය | - | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය, ප්‍රධාන කාර්යාලය. 99/1, ජාවත්ත පාර, කොළඹ 05 |

---

පසුබිම

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය රාජ්‍ය ආරක්ෂක, හා ආපදා කළමනාකරන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පොදු ව්‍යවසාය ආයතනයක් (ව්‍යවස්ථාපිත මණ්ඩල) අතර එහි තාක්ෂණික අංශ 06 ක් සහ මුදල් හා පාලන අංශ ඇතුලුව අංශ 08 ක් ක්‍රියාත්මක වේ. ජාතික ගෙඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අනුමත කාර්ය මණ්ඩලය 386 ක් වන අතර වර්තමානය වන විට ස්ථිර කාර්ය මණ්ඩලය 326 කි. ආයතනයේ කාර්යභාරය තුල නායයාම් අවදානම් කළමනාකරණය, පාරිසරික කළමනාකරණය, මානව ජනාවාස සැළසුම්කරණය, ඉංජිනේරුමය ව්‍යාපෘති කළමනාකරණය භූ තාක්ෂණ ඉංජිනේරු, හා ගොඩනැගිලි ද්‍රව්‍ය තත්ව පාලන කටයුතු ඉටුකරණ අතර ප්‍රධාන විද්‍යාගාර 3 ක් ද ක්‍රියාත්මකවේ, තවද ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය යටතේ. ස්ථායිකරණ ක්‍රමවේද මගින් නායයෑම් අවදානම අවම කිරීමේ ප්‍රධාන ව්‍යාපෘතියද වේ.

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ හා ආයතනය යටතේ ක්‍රියාත්මක වන ස්ථායිකරණ ක්‍රමවේද මගින් නායයෑම් අවදානම අවම කිරිමේ ව්‍යාපෘති කාර්ය මණ්ඩලයේ මානව සම්පත් කළමනාකරණ කටයුතු සඳහා පළපුරුදු මානව සම්පත් කළමණාකාරවරයෙකුගේ සේවය ලබාගැනීමට සැලසුම් කර ඇත.

මේ සඳහා සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක මානව සම්පත් සම්බන්ධ කටයුතු සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ අත්දැකීම් ඇති පශ්චාත් උපාධි මට්ටමේ සුදුසුකම් ලත් මානව සම්පත් කළමනාකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

කොන්ත්‍රාත්/පැවරුම් කාර්යභාරය

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය හා ස්ථායිකරණ ක්‍රමවේද මගින් නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය සදහා මානව සම්පත් කළමනාකරන සැලැස්ම සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම හා අදාළ කාර්යයන්.

කාර්යභාරය

(1) <u>ආයතනයේ බඳවා ගැනීම් පටිපාටිය සංශෝධනය කිරීම,</u>

- ආයතනයේ වර්තමාන කාර්යයභාරය අධ්‍යයනය කර අවශ්‍යතාවයට අනුව තනතුරු සංඛ්‍යාව/ කාර්යමණ්ඩල හදුනා ගැනීම හා වාර්තාකිරීම

- ආයතනයේ තනතුරු හා එම තනතුරුවලට අදාල විෂය ක්ෂේත්‍රය අධ්‍යයනය කර තනතුරුවලට අදාලව බඳවා ගැනීම් පටිපාටියේ සුදුසුකම් සංශෝධනය කිරීම.
- තනතුරුවලට අදාල රාජකාරි සහ කාර්යයන් යාවත්කාලීන කිරීම.

(2) <u>කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම</u>

බඳවා ගැනීම් පටිපාටිවල සඳහන් විෂය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි සියළුම සේවක කාණ්ඩ සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම හා උසස්වීම කාර්යය පටිපාටිය ක්‍රියාත්මක කිරීම

(3) <u>ආයතනය සඳහා ආයතන සංගහ්‍රයක් පිළියෙල කිරීම.</u>

ආයතනයේ සියළු අංශ මෙන්ම සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය වන පරිදි පාලන, මානව සම්පත් හා ක්‍රියාකාරකම් වෙනුනේ ආයතන සංගහ්‍රයක් පිළියෙල කිරීම.

(4) <u>මානව සම්පත් සැලැස්මක් පිළියෙල කිරීම</u>

ආයතනයේ වර්තමාන කාර්යයභාරය අධ්‍යයනය කර ඉදිරි වර්ෂ 05 සඳහා ආයතනයේ සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය වන පරිදි සමස්ථ කාර්ය මණ්ඩලයේ මානව සම්පත් සංවර්ධනය කිරිම සඳහා මානව සම්පත් සැලැස්ම පිළියෙල කිරීම.

සහ

ආයතනයේ අනෙකුත් මානව සම්පත් සහ පරිපාලන කටයුතුවල අධීක්ෂණ හා උපදේශනකටයුතු

සුදුසුකම්ලත් මානව සම්පත් කළමනාකරුවන් සිය අයදුම්පත් අධ්‍යාපන සුදුසුකම්, හා ජීවදත්ත සමඟ පළපුරුද්ද සහ ඉටු කරන ලද සමාන වැඩ පිළිබඳ විස්තර ඉදිරිපත් කල යුතුය.

කාර්යක්ෂමතාවය පදනම් කරගෙන මාස 6 කින් ඔබ්බට දීර්ඝකිරීමේ පදනමින් මෙම පැවරුම වර්ෂයක කාලයක් සඳහා බලපැවැත්වෙන අතර මාසිකව රු. 125,000.00. ක වේතනයක් ගෙවනු ලැබේ මෙම පැවරුම සඳහා බඳවා ගන්නා කළමනාකරු පූර්ණ කාලීනව සේවා ස්ථානයට වාර්ථා කලයුතු වේ.

මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු එන් එස් ඒ කේ කුරේ මහතා (වැඩබලන අධ්‍යක්ෂ) දු.ක. අංක 0714943117මගින් ලබාගත හැකිය.

ඉංජිනේරු (ආචාර්ය) ආසිරි කරුණාවර්ධන
අධ්‍යක්ෂ ජනරාල්
ජා.ගො.ප. සංවිධානය.